# 11

# වැහි වලාකුළ

**කුමාරතුංග මුනිදාස (1887-1944)**

සිංහල භාෂා හා සාහිත්‍ය ක්ෂේත්‍රයේ විප්ලවීය වෙනසක් සිදු කළ අමරණීය චරිතයක් ලෙස කුමාරතුංග මුනිදාසයන් සැලකිය හැකි ය. මොහු ලේඛකයකු, භාෂා ප්‍රවීණයකු, විචාරකයකු, පුවත්පත් කතුවරයකු මෙන් ම කවියකු ලෙස ප්‍රකට ද්විභාෂක උගතකු වූ අතර පාඨශාලාචාර්යවරයකු ලෙස සිය වෘත්තීය ජීවිතය ඇරඹී ය. 1917 දී 'සාමාන්‍ය දැනීම' පිළිබඳ ප්‍රශ්න මැයෙන් ග්‍රන්ථයක් පළ කරමින් ග්‍රන්ථකරණයට අවතීර්ණ වූ කුමාරතුංග කව්සිළුමිණ, නිකාය සංග්‍රහය ආදි සම්භාව්‍ය ගද්‍ය, පද්‍ය ග්‍රන්ථ ගණනාවක් සංස්කරණය කරමින් ද කාව්‍ය ගීත හා ප්‍රබන්ධකරණය උදෙසා උපදෙස් සපයමින් කවි ශික්ෂාව, විරිත් වැකිය, හෙළ මියැසිය හා ප්‍රබන්ධෝපදේශය ප්‍රබන්ධ සංග්‍රහය පළ කරමින් ද ස්වකීය ප්‍රඥා මහිමය ප්‍රකට කළේ ය.

සිංහල භාෂාවේ ව්‍යාකරණය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ මොහු, භාෂාව ශුද්ධ වස්තුවක් ලෙස සලකමින් මිශ්‍ර සිංහලය බැහැර කරමින් සම්භාව්‍ය යුගයේ ග්‍රන්ථ ඇසුරින් සිංහල ව්‍යාකරණයේ සැඟවී පැවති රීති සම්ප්‍රදායන් අනාවරණය කරමින් ඊට අනුරූප ව වත්මන් භාෂා භාවිතය සකස් විය යුතු ය යන දැඩි මතයෙහි එල්බ ගනිමින් සිංහල භාෂා පුනර්ජීවනයෙහි නියැලුණේ ය. 'හෙළහවුල' නම් වූ භාෂා ප්‍රේමීන්ගේ එකමුතුව ගොඩනගා ගත් කුමාරතුංග 1939 දී 'සුබස' සඟරාවේත්,



1931 දී 'ලක්මිණි පහන' පුවත්පතේ සංස්කාරක ධූරය ඉසිලී ය. මොහුගේ නිර්මාණාත්මක ප්‍රතිභාව වඩාත් විශද වන්නේ කාව්‍ය නිර්මාණ ඇසුරිනි. **හීන්සැරය, හත්පණ, මගුල් කෑම, කුමාර ගී** යන කෘති ළමා පරපුර අතර බෙහෙවින් ජනප්‍රිය ළමා ග්‍රන්ථ වන අතර '**පියසමර**' මොහුගේ කවීත්වයේ අග්‍ර ඵලය ලෙස සැලකිය හැකි වේ. ළමයින් සඳහා මෙන් ම වැඩිහිටියන් සඳහා කළ මොහුගේ කාව්‍ය නිර්මාණවල වූ අපූර්වත්වය හා සාරවත් බව පාඨකයා කෙරෙහි එලෙසින් ම සන්නිවේදනය නොවීම කෙරෙහි හෙළ හවුලේ දැඩිතර භාෂා මතවාද ප්‍රබල පවුරක් විය.

1. වැහි වලා කුළ, පෑ කළු යැ යි ඔබේ
නො හොබිති යි කිසි ලෙස් නොසතොස් නොවන්
සිරුරු පැයෙනු'ගත් සුදනෝ ලොවේ
නො හඳුනත් උතුමන් ගුණයෙන් විනා

2. පැනැ - නැඟී අහසේ පැතිරී ගොසින්

මහ ගිමන් සිඳුවා සත සිත් තොසින්
කුඹුරු - වැව් - පොකුණුත් පුරවා දියෙන්
ලොවට දෙන්නො ඔබ යි අහරත් පැනුත්

3. නද අසා ඔබ ගේ පැහැයත් බලා
මොනරු පිල් විදහා රඟ දෙත් නදින්
අමුතුයෙන් පණවත් බව ලත් සෙයින්
තුරු ලියත් ලිය-ලයි සැනැසී දියෙන්

4. සුදු වලා කුළු බෝ මැ අහස් කුසේ
ඉහළ යෙයි ඔබ යැම පහත් වැ මැ යි
එ පුදුමෙක් ද උසස් නැණවත් දනෝ
ගුණ බරින් නැමුණෝ'වි පවතින් නිතින්

5. කටට ගැන්ම ද බෝ මැ අමාරු වූ
කර දියත් ඔබ ගත් කලැ සාගරෙන්
මිහිරි වෙයි උතුමන් සහ වාසයෙන්
නිවටයෝ ද උසස් වෙති බෝ සෙයින්

6. ගුණ බලා ඔබ ගේ ලො සොබා දහම්
'ඔබැ'ර අන් කිසිවෙක් නිසි නැ' කියා
විදුලියත් පැහැ පත් රන දම් සෙයින්
පළඳවන්නෙ ඔබේ ගෙලෙ මැ යි බලන්

**කියවන නුවණ**

## ලිඛිත අභ්‍යාස

1. වැහි වලාකුළ ඇසුරෙන් කුමාරතුංග කවියා උසස් මානව ගුණ ධර්ම නිරූපණය කරයි. ඒවා පහදන්න.
2. "කළු පැහැය පිළිබඳව සමාජයේ පවතින ආකල්පය නිෂේධනය කිරීමට වැහි වලාකුළ නිර්මාණය සමත් වෙයි" විමසන්න.
3. වැහි වලාකුළ පැදි පෙළ සාර්ථක නිර්මාණයකි. ඔබගේ අදහස් දක්වන්න.
4. පරිසරයේ විවිධ අවස්ථා ස්වකීය නිර්මාණයේ සාර්ථකත්වය සඳහා යොදා ගැනීමට කවියා දක්වා ඇති ප්‍රතිභාව 'වැහි වලාකුළ' ඇසුරෙන් විමසන්න.